// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1701/10 – 2011 අප්‍රේල් 11 වැනි සඳුදා – 2011.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම රක්ෂිතයක් ලෙස පවත්වා ගෙන යෑම සඳහා වලංකන්දෙ මූකලාන නමැති ඉඩම අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ පත්තුව සුළු කොට්ඨාසයේ, රඹුක ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ආර්/කේඑල්ඩබ්/97/246 හා 1999.01.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ අ.ග.සි. 943 හි කැබලි අක්ෂර 'අ' සහ 'ආ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.8690ක් පමණ වූ, වලංකන්දෙ මූකලාන නමැති ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර 'අ' – වලංකන්දෙ මූකලාන – ප්‍රමාණය: හෙක්. 2.3540ක් පමණ**

උතුරට: අ.ග.සි. 943හි 2 වැනි කැබැල්ල හා අ.ග.සි. 701; නැගෙනහිරට: අ.ග.පි. 701; දකුණට: අ.ග.සි. 943හි 10 වැනි කැබැල්ල; බටහිරට: අ.ග.සි. 943හි 2 වැනි කැබැල්ල.

**02. කැබලි අක්ෂර 'ආ' – වලංකන්දෙ මූකලාන – ප්‍රමාණය: හෙක්. 0.5150ක් පමණ**

උතුරට: අ.ග.සි. 943හි 10 වැනි කැබැල්ල; නැගෙනහිරට: අ.ග.පි. 701; දකුණට සහ බටහිරට: අ.ග.සි. 943හි 2 වැනි කැබැල්ල.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 03/ජේ/93/එෆ්ආර්/01.
2010 දෙසැම්බර් මස 29 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 - 744


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.